**පූජාපිටිය ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 4 ක එකතු වටිනාකම රු.19,572,485 ක් වූ අතර, එයින් අවුරුදු 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂ එකතුව රු.3,829,402 ක් වී තිබුණි. 2017 අප්‍රේල් 30 දිනට රු.19,207,431 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට පැවති කර්මාන්ත 83 ක ණයහිමි ශේෂ එකතු වටිනාකම රු.28,803,447 ක් වු අතර, එයින් අවුරුදු 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවා තිබු ශේෂවල එකතුව රු.4,274,053 ක් වී තිබුණි.**

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**2014 දෙසැම්බර් 31 දක්වා පැවති රු.2,022,228 ක පොදු තැන්පත් ශේෂය පරීක්ෂා කිරීමට හැකි වන ආකාරයට ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එම ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.**

**1.3.3 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව නැවත සේවයේ යොදවනු ලැබූ විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප සමග නියමිත ජීවන වියදම් දීමනාව දිගටම ලැබෙන අතර, නැවත සේවයේ යෙදවීම/ පත් කිරීම යටතේ ඔහුට ජීවන වියදම් දීමනාව හිමි නොවන නමුත්, 2015 මැයි 01 දින සිට මාස 6 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා නැවත කාලය දීර්ඝ කර තිබූ තාක්ෂණ සේවයේ (සිවිල්) නිලධාරීවරයෙකුට නැවත සේවයේ යෙදවීම වෙනුවෙන් ලබා දෙන දීමනාවට අමතරව මසකට රු.4,275 ක් බැගින් ජීවන වියදම් දීමනාවක් ලෙස රු.32,062 ක් 2016 මැයි සිට දෙසැම්බර් දක්වා කාලයට ගෙවා තිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.11,992,559 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.8,147,059 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.3,845,500 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 වරිපනම්.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) 2016 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,911,094 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.3,133,016 ක් වී තිබුණි. මින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.1,884,838 ක් හා රු.1,938,663 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 64 ක් හා සියයට 62 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට රු.2,220,609 ක හිඟ ශේෂයක් පැවති අතර, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.**

**(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.80,184 ක හිඟ වරිපනම් බදු මුදලක් වර්ෂ කීපයක සිට ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**2.2.2 වෙනත් ආදායම්.**

-------------------

(අ) ත්‍රී රෝද රථ ගාස්තු.

---------------------

ත්‍රී රෝද රථ නැවතුම් සඳහා එක් රථයකින් මසකට රු.50 ක් අය කිරීමට සමාලෝචිත වර්ෂයේ දී තීරණය කර ඇතත්, 2016 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි වී තිබූ ත්‍රීරෝද රථ 43 කින් අතුරු ව්‍යවස්ථා සම්මත කර ගෙන රු.25,800 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැන්වීම් පුවරු ගාස්තු

----------------------

සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ පෞද්ගලික ආයතන 10 කට අයත් දැන්වීම් පුවරුවලින් රු.881,600 ක මුදලක් අය වීමට තිබූ අතර, මෙම මුදල් වසර 1 ත් වසර 3 ත් අතර කාල පරාසයක සිට අය නොවී පැවතුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.637,841 ක් හා මුද්දර ගාස්තු රු.9,191,420 ක් අය වියයුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

3.1 කාර්යසාධනය.

------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට සභාවේ පුනරාවර්තන ආදායම රු.24,243,850 ක් වූ අතර, එයින් රු.135,710 ක් හෙවත්, සියයට 0.6 ක් පමණක් සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණි. මේ අනුව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය පරිදි ප්‍රාදේශීය සභාවේ අරමුණු හා කාර්යයන් ප්‍රමාණවත්ව ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85(ආ) වගන්තියේ සඳහන් පරිදි එක් එක් ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මහජනයා ගැවසෙන සියලු ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි ඉඩ පහසුකම් සැපයීම ප්‍රාදේශීය සභාවේ කාර්යභාරයක් වුවත්, අංකුඹුර නගරයේ පිහිටි මහජන වැසිකිළියේ පූතික ටැංකියට උල්පත් ජලය එකතු වී නිරතුරුවම උතුරා යාම මත වසරකට වඩා වැඩි කාලයක සිට භාවිතයට ගැනීමකින් තොරව වසා දමා තිබුණි. ඒ අනුව, දෛනිකව විශාල ජනතාවක් ගැවසෙන අංකුඹුර නගරයට අත්‍යවශ්‍ය පොදු වැසිකිළි පහසුකම් සැපයීමට ප්‍රාදේශීය සභාවට නොහැකි වී තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තියේ සඳහන් පරිදි වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම්වලට යටත්ව එක් එක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා වූ

පොදු පරිපාලන අධිකාරිය විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් අංක 2 යටතේ වැය විෂයයන් 5 කට වෙන් කර තිබූ රු.34,000 ක ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට උපයෝගී කිරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දින වන විට සියයට සියයක්ම ඉතිරි කර තිබුණි.

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 වගන්තියේ සඳහන් පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලු මංමාවත්වලින් හෝ විවෘත භූමි භාගවලින් හෝ ඒවා සම්බන්ධයෙන් හෝ උද්ගත වන සියලු පොදු අයිතිවාසිකම් සම්බන්ධතා සහ පහසුකම් ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද, එම මංමාවත් හෝ විවෘත භූමි භාග පොදු කාර්යයන් සඳහා උපයෝගී කර ගැනීම විධිමත් කිරීම, සකස් කර ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ද අවශ්‍ය පියවර ගැනීම සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යය විය යුතු වුවත්, වැඩසටහන් අංක 3 යටතේ වැය විෂයයන් 5 කට වෙන් කර තිබූ රු.66,000 ක ප්‍රතිපාදන එම අරමුණු ඉටු කිරීමට උපයෝජනය නොකර 2016 දෙසැම්බර් 31 දින වන විට සියයට සියයක්ම ඉතිරි කර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.
---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාවේ අනුමත නොවූ තනතුරු 3 ක් සඳහා සේවකයින් 12 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර, එම තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මාර්ග කම්කරු, සනීපාරක්ෂක කම්කරු හා කම්කරු යනාදි තනතුරු හිමි සේවකයින් 7 දෙනෙකු කාර්යාලයේ ආදායම් කටයුතු, පෙර පාසල් කටයුතු, මහජන පැමිණිලි යනාදි වගකිව යුතු රාජකාරී හා සේවාවන් සඳහා යොදවා ගෙන තිබුණි. මේ හේතුවෙන්, මානව සම්පත් අවිධිමත්ව උපයෝජනය කරන බවක් නිරීක්ෂණය වූ අතර, මෙම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,204,339 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) වෙනත් ආදායම් විෂයයන් 5 ක් යටතේ ලැබිය යුතු රු.401,576 ක ශේෂයක් වසර ගණනාවක සිට අය විය යුතුව ඇතත්, එම ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව සමග සැසඳීමේ දි පුරප්පාඩු තනතුරු 11 ක් හා අතිරික්ත තනතුරු 14 ක් පවතින බවක් නිරීක්ෂණය විය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු පූජාපිටිය, අඹතැන්න හා අංකුඹුර වෙළද සංකීර්ණ 3 ක කඩ කාමර 66 ක් පැවති අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව සතු කඩ කාමර බදු දීමේ දි සභාව සහ බදුකරු අතර බදු ගිවිසුමකට එළඹීමකින් තොරව සභාව සතු පූජාපිටිය වෙළද සංකීර්ණයේ කඩ කාමර 06 ක් බදු දි තිබුණි.

(ii) බදු ගිවිසුමේ 27 වගන්තිය අනුව, හා 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 වගන්තිය අනුව, බදු දෙන ලද කඩ කාමර බදුකරු විසින් වෙනත් පාර්ශවයකට අතුරු බදු දීම හෝ විකිණීම නොකළ යුතු වුවත්, ඉහත වෙළද සංකීර්ණ 3 හි කඩ කාමර 23 ක් රු.3,000 ත් රු.10,000 ත් අතර මාසික කුළි මුදලකට වෙනත් පාර්ශවයන්ට අතුරු බදු දි තිබුණි.

(iii) බදු ගිවිසුමේ 20 වගන්තිය ප්‍රකාරව දින 5 කට වඩා කඩ කාමර වසා නොතැබිය යුතු වුවත්, මෙම වෙළද සංකීර්ණ 3 හි කඩ කාමර 7 ක් වසරකට වඩා වැඩි කාලයක සිට වසා දමා තිබුණි.

(iv) ඉහත වෙළද සංකීර්ණ 3 හි කඩ කාමර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තක්සේරු වාර්තා 2016 සැප්තැම්බර් 09, 2015 මාර්තු 02 හා 2016 මැයි 30 යන දිනයන්හිදි සභාවට ඉදිරිපත් කර ඇතත්, 2017 ජනවාරි 10 දින වන විටත් එම වාර්තාවට අනුව කඩ කුළී සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) අඹතැන්න වෙළද සංකීර්ණයේ කඩ කාමර අංක 10, 11 සහ 12 යන කඩ කාමර 3 ට විරුද්ධව නඩු පවරා ඇති බැවින්, මෙම කඩ කාමර 2007 වර්ෂයේ සිට වසා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අනාවරණය කර ගෙන තිබුණු අනවසර ඉදි කිරිම් 9 ක් සම්බන්ධයෙන් නඩු පැවරීමට තීරණය කර ඇතත්, 2017 ජනවාරි 10 දින වන විටත් එම ඉදි කිරීම් සම්බන්ධව නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

3.4 මතබේදයට තුඩු දුන් ගනුදෙනු.
-----------------------------------

අඹතැන්න වෙළද සංකීර්ණයේ ඉහළ මහලේ අංක 3 කඩ කාමරය අවිධිමත් ලෙස බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත කඩ කාමරය බදු ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයකට ලබා දී තිබුණි.

(ආ) මෙම කඩ කාමරය 2007 වර්ෂයේ සිට කුළි අය කිරිමක් කර නොතිබුණි. තවද, කඩ කුළි ලේඛනයේ ඇතුළත් කර බිල් කිරිම් ද කර නොතිබීම නිසා, සභාවට රු.120,000 ක ආදායමක්

අහිමි වි තිබූ අතර, මෙම කඩ කාමරය **2015** මාර්තු **05** දින සිට වෙනත් පාර්ශවයක් විසින් පදිංචිය සඳහා යොදා භාවිතයට ගෙන තිබුණි.

(ඇ) අදාළ කඩ කාමරය වෙනුවෙන් හිඟ හිට තිබු රු.**200,000** ක මුදල, සභාවේ හිටපු සභිකයකුගෙන් **2012** අප්‍රේල් **08** දිනැතිව කළ ඉල්ලීම අනුව ඔහුගේ දීමනාවෙන් කොටස් වශයෙන් අය කර ගෙන තිබුණි.

(ඇ) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **219** වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක කිසියම් සභිකයෙකුට හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමග ඇති කරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩයක සම්බන්ධතාවයක් හෝ මූල්‍ය සම්බන්ධතාවයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතු වුවත්, ඉහත අංක **03** කඩ කාමරයේ හිඟ හිටි මූලික මුදල එවකට හිටපු සභිකයෙකුගේ දිමනාවෙන් අය කර ගෙන තිබුණි.

**3.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය විය.

(අ) රු.**14,767,144** ක් වටිනා වාහන **4** ක් හා වටිනාකම හඳුනා නොගත් වාහන **2** ක් වසර **1** ත් වසර **3** ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම යටතේ රු.**2,521,700** ක මුදලක් වැය කර කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදි කර **2015** ජනවාරි **20** දින වැඩ අවසන් කර ඇතත්, එදින සිට අදාළ මධ්‍යස්ථානය වසා දමා තිබුණි.

(ඇ) සභාව සතු මාරතුගොඩ ශරීර සුවතා මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම සඳහා ක්‍රීඩා උපදේශකවරයෙකු නොමැති වීම මත **2015** සැප්තැම්බර් **14** දින සිට වසා දමා තිබූ අතර, ඒ හේතුවෙන්, රු.**624,269** ක් පමණ වටිනා කාය වර්ධන උපකරණ භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**3.6** කොන්ත්‍රාත් පරිපාලනය.

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන යෝජනා වර්ෂය ආරම්භයේ දි අනුමත කර ගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබිය දි, සභාව විසින් රු.**689,122** ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමින් යුතු සංවර්ධන යෝජනා **5** ක් අනුමැතිය සඳහා **2016** මැයි **20** හා **2016** ජුලි **26** යන දිනයන්වල ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා පළාත්

පාලන කොමසාරිස් වෙත යවා තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට මෙම යෝජනා සඳහා අනුමැතිය ලැබී ඉන් 3 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු.5,775,000 ක් වූ ඇස්තමේන්තුගත අගයකින් යුතු කර්මාන්ත 16 ක් සඳහා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී තිබුණ ද, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,750,000 ක් වටිනා කර්මාන්ත 5 ක වැඩ ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
------------------------------------------

4.1 අයවැය පාලනය.
------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී ආදායම් විෂයයන් 5 ක සියයට 28 සිට සියයට 51 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 24 සිට සියයට 69 ක් දක්වා ද විචලනයක් නිරික්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට වැය විෂයයන් 26 ක් සඳහා වෙන් කර තිබූ රු.589,500 ක ප්‍රතිපාදන සියයට සීයයක්ම භාවිතයට ගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.
---------------------------------

සමාලෝචිත වර්ෂයේ දි රු.37,167,717 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.3 සංයුක්ත සැළැස්ම.
----------------------

සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්ම පිළියෙළ කර නොතිබුණි.

4.4 ක්‍රියාකාරී සැළැස්ම.
----------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනය.**

**---------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ)** **කොන්ත්‍රාත් පරිපාලනය**

**(ආ)** **ආදායම් පරිපාලනය**

**(ඇ)** **වත්කම් කළමනාකරණය**

**(ඈ)** **ණයගැතියන් හා ණයහිමියෝ**